**බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය සහාය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය අදියර - II (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය) - 2016**

---

බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය සහාය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතියේ අදියර II (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සීමාසහිත හොංකොං සහ ෂැන්හායි බැංකු සහයෝගීතා සමාගම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2013 ජුනි 21 දින එළඹි අංක 53එම්/එෆ්සී/1448(201327/එස්එල්) දරන ණය ගිවිසුමේ I කොටස සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ග්‍රාමීය පාලම් 104 ක් ඉදිකිරීම සඳහා සැලසුම් කිරීම, මැනුම් කිරීම හා යකඩ ද්‍රව්‍ය සැපයීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා තාක්ෂණික සහාය සහ පුහුණුව ලබා දීමයි. ඒ සඳහා 2012 අප්‍රේල් 26 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් විදේශීය සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ණය ගිවිසුමට අනුව මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුලු පිරිවැය ස්ටර්ලිං පවුම් මිලියන 56.50 කට (ඇ.එ.ජ.ඩො මිලියන 88.72) සමාන රු. මිලියන 12,275.13 ක් වූ අතර ඉන් ස්ටර්ලිං පවුම් මිලියන 45 කට (ඇ.එ.ජ.ඩො මිලියන 70.65) සමාන රු. මිලියන 9,775.13 ක් සීමා සහිත හොංකොං සහ ෂැන්හායි බැංකු සහයෝගීතා සමාගම විසින් ලබා දීමට එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් 19 දින ආරම්භ කරන ලද අතර 2017 සැප්තැම්බර් 18 දින එය අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව

සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

2016 දෙසැම්බර් 31 දිනට සිවිල් ඉදිකිරීම්, විදුලි රැහැන් මාරුකිරීම හා මාර්ග සංඥා ඉදිකිරීම ආදී කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 88.92 ක මුදල මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

--------------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2016 දෙසැම්බර් 31 දිනට** | |
| | ඇ.එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.එ.ජ.ඩො මිලියන | රු. මිලියන | ඇ.එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| එච්එස්බීසී | 70.65 | 9,775.13 | 1,050.00 | 7.01 | 1,012.97 | 67.73 | 8,995.72 |
| ශ්‍රීලංර | 18.07 | 2,500.00 | 580.00 | 3.50 | 531.00 | 11.12 | 1,664.93 |
| එකතුව | **88.72** | **12,275.13** | **1,630.00** | **10.51** | **1,543.97** | **78.85** | **10,640.65** |

**3.2 භෞතික ප්‍රගතිය**

-------------------

ලද තොරතුරු අනුව, කොන්ත්‍රාත්තුවට අයත් වැඩ විෂයපථය යටතේ දිග මීටර් 3,077.90 කින් යුත් ග්‍රාමීය පාලම් 104 ක් මැනුම් කිරීම, සැලසුම් කිරීම, තාක්ෂණික සහය හා පුහුණුව සහ අමුද්‍රව්‍ය සැපයීම සඳහා පිරිවැය ස්ටර්ලිං පවුම් මිලියන 45 කට (ඇ.එ.ජ.ඩො. මිලියන 70.65) සමාන රු.මිලියන 9,778.05 ක මුදලක් සඳහා විදේශ සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට අවස්ථා 07 කදී එය වෙනස් කර තිබුණු අතර, විකල්ප පාලම් 16 ක් හා සංයුක්ත පාලම් (Composite Bridge) 02ක් ද ඇතුළුව දිග මීටර් 3,142 ක් වූ පාලම් 80 ක් සඳහා වානේ අමුද්‍රව්‍ය සැපයීමට එකඟ වූ අතර එයින් 2016 දෙසැම්බර් 31 දිනට තාවකාලික පාලම් 16 ක් හා එක් සංයුක්ත පාලමක් ඇතුළුව පාලම් 66 ක වැඩ අවසන් කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකභාවය නිසා කොළඹ දිස්ත්‍රික්කයේ කළුඅග්ගල පාලමේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂයේදී අතරමග අත්හැර දමා තිබුණි. එහි වැඩ කටයුතු අත්හැර දමන අවස්ථාව වන විට උපරි ව්‍යූහය (Superstructure) සැපයුම් පිරිවැය රු.මිලියන 15.51 ක්ද ඇතුළුව රු.මිලියන 45.78 ක් වියදම් දරා තිබූ බව නිරීක්ෂණය විය. මීට අමතරව, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ කුඹුක්කන් ඔය හරහා වන අනෙක් පාලමේ ඉදිකිරීම් කටයුතුද අත්හැර දමා තිබූ අතර ඒ වෙනුවට කොන්ක්‍රීට් පාලමක් ඉදිකිරීමට තීරණය කර තිබුණි. මේ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු.මිලියන 3.04 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල (Mobilization Advance) 2016 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 34 ක් සඳහා දින 31 සිට දින 453 ක පරාසයක් තුල කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. මේ අතරින්, කොන්ත්‍රාත් 14 ක් සඳහා ලබාදී තිබූ කාලය දීර්ඝ කිරීම් ව්‍යාපෘතිය විසින් අවම කරගත හැකිව තිබූ නිර්මාන (Design) හා කාර්ය විෂය පථය වෙනස් වීම, අමතර කාර්යයන් හා අමුද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් නොමැතිකම ආදී කරුණු හේතු වී තිබුණි.

(ඇ) ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයෙන් ලද තොරතුරු අනුව, අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව පාලම් නිර්මාණ කාර්යයන් විදේශීය සමාගම විසින් සිදුකල යුතුව තිබුණද, ස්ථිර පාලම් 65 අතරින් ස්ථිර පාලම් 49 ක නිර්මාණ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියේ පාලම් නිර්මාණ කාර්යාලය විසින් සිදුකර තිබුණු අතර ඒ සඳහා 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 9.24 ක් ගෙවා තිබුණි.

**3.4 මූල්‍ය පාලන ගැටළු**

------------------------

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් 2014 වර්ෂයේදී ලබාගත් ණය මුදල වෙනුවෙන් වෙන් කළ රු.මිලියන 327 ක මුදල 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු මුදලක් ලෙස පෙන්වා තිබුණ ද, එය නිරවුල් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ උපදේශකවරුන් 05 දෙනෙකු සහ මහජන සම්බන්ධතා නිලධාරීන් 04 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර, ඔවුන්හට සමාලෝචිත වර්ෂය තුල වැටුප් හා ප්‍රවාහන දීමනා වශයෙන් එකතුව රු. මිලියන 2.03 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.